**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 04/2020

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

2020 අගෝස්තු මස 10 වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් නවක වදය හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SGBV) සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල/ මණ්ඩප / ආයතන වෙත ඉදිරිපත් කරන පැමිණිලි**

විශ්වවිද්‍යාලවලට බලපාන මූලික ගැටළුවක් නම් නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ඇතුළු හිංසනයයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන දහස් ගණන් නවක සිසුන්ව ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨයින් විසින් හිංසනයට ලක් කිරීම, හිරිහැර කිරීම සහ අපයෝජනය කිරීම සිදු වේ. නවක වදය කිරීමේ චාරිත්‍රය හරහා දාසභාවය, යටත් වීම සහ අනුකූල වීමේ සංස්කෘතියක් පැනවේ. ප්‍රචණ්ඩත්වයට මුහුණ දීමට නොහැකි වූ බොහෝ සිසුන් උසස් අධ්‍යාපනය පිළිබඳ සිහින අත්හරින අතර ඇතැමුන් සියදිවි හානි කර ගෙන ඇත. සමහර විට සිසුන්ට පමණක් නොව කාර්ය මණ්ඩල සාමාජිකයින්ට පවා ලිංගික හිංසනයන් එල්ල වන අතර එමඟින් ඔවුන් ලිංගික හිංසනයකට ගොදුරු වීම නිසා ජීවිත කාලයම දුක් විඳීමට සිදු වේ. මෙම  බොහෝ සිදුවීම් වාර්තා නොවන අතර අපරාධකරුවන්ට දඬුවම් නොලැබේ. විශ්වවිද්‍යාල විසින් විවිධ මට්ටම්වල සාර්ථකත්වයන් සහිත විවිධ තාවකාලික පියවරයන් ගැනීමට උත්සාහ කර ඇතත් ප්‍රචණ්ඩත්වයට ඔරොත්තු දෙන ධනාත්මක හා තිරසාර ආයතනික සංස්කෘතියක් ඇති කිරීමට අසමත් වී ඇත.

එබැවින් රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ ආරක්ෂිත හා හිතකර පරිසරයක් ඇති කිරීමේ අදහසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2020  ජුනි 11 දින පැවති සිය 1032 වන සභාවාරයේ දී ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් නවක වදය හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SGBV) සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පැමිණිලි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කරන මෙන් විශ්වවිද්‍යාල / මණ්ඩප / ආයතන වෙත උපදෙස් දීමට තීරණය කරන ලදී.

එබැවින්, ඔබේ ආයතනයට ලැබෙන නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SGBV) පිළිබඳ පැමිණිලි හා  එවැනි පැමිණිලි සම්බන්ධයෙන් ගත් ක්ෂණික පියවරයන් සමඟ එම පැමිණිලි ඔබේ ආයතනයට ලැබී දින 7 ක් ඇතුළත සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් ඔබෙන් ඉල්ලා සිටිමි.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ.කලේ. **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග**
සභාපති

පිටපත් :

1. ලේකම්/ උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
7. පීඨාධිපතිවරුන්
8. ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/ සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් / සහකාර ලේඛකාධිකාරීවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ලිපි ගොනු අංක : යූජීසී/ සිජීඊ/ පීඔ_ඩී -01